සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 08 - 2023

## බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු දෙක (02) බැගින් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

### I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වල දී ඇති පිළිතුර අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. එක ගාථාවක් මාස හතරක් පුරා පාඩම් කළ ද එක ගාථා පදයක්වත් මතකයේ නොරැඳුණු තෙරුන් වහන්සේ වූයේ,
    1. ආනන්ද තෙරුන් ය.  2. නන්ද තෙරුන් ය
    3. චුල්ලපන්ථක තෙරුන් ය.  4. මහාපන්ථක තෙරුන්ය

02. "ඉඳ ඉඳ එක වෙහෙර - විඳ විඳ දහම් මනහර" ............ යන කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය නම්,
    1. කාව්‍ය ශේඛරයයි  2. ගුත්තිල කාව්‍යයි  3. බුදුගුණ අලංකාරයයි  4. සිරිත් මල්දමයි

03. තමාට මෙලොවදීම දැන දැක ගත හැකි වීම නිසා ධර්මය,
    1. සන්දිට්ඨික වේ.  2. අකාලික වේ.  3. ඕපනයික වේ.  4. ඒහිපස්සික වේ.

04. සැවැත් නුවර දෙවරම් වෙහෙර බුදුරජාණන් වහන්සේට පූජා කළේ,
    1. බිම්බිසාර රජතුමා ය  2. විශාඛා සිටුදේවිය ය  3. උදේනි රජතුමා ය  4. අනේපිඬු සිටුතුමා ය.

05. "යුතුකම් හා වගකීම්" පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය වන්නේ,
    1. රතන සූත්‍රය යි  2. මහා මංගල සූත්‍රය යි
    3. දම්සක් පැවතුම් සූත්‍රය යි.  4. සිගාලෝවාද සූත්‍රය යි

- අංක 06 සිට 10 තෙක් දී වගන්ති හරිනම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. අල්ප ශබ්දතාවයට බුදුරජාණන් වහන්සේ මහත් සේ ඇලුම් කළ සේක. (............)

07. ජාතක කතා පොත් වහන්සේ රචනා කළේ දඹදෙණි යුගයේ දී ය. (............)

08. අරියවංශ ධර්ම දේශනා පැවැත්වීම පැරණි බෞද්ධයන් සිදු කළ ආගමික චාරිත්‍රයක් නොවේ. (............)

09. චණ්ඩාශෝක ධර්මාශෝක රජ බවට පත්වූයේ නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගෙන් දහම් ඇසීමෙනි. (............)

10. තරුණියක තරුණයෙකුට සරණකරදීම විවාහය වේ. (............)

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න. **(කිඹුල්වත් නුවර / පරිමණ්ඩල / රජගහ නුවර / අටුවා / සේඛියා)**

11. දෙමාපිය අවසරයකින් තොරව දරුවන් පැවිදි නොකරන ලෙස බුදුරජාණන් වහන්සේ ශික්ෂා පදයක් පනවා වදාළේ ........................................................................... දී ය.

12. ........................................................... දී පළමු වරට සුදත්ත සිටුවරයා බුදුරජාණන් වහන්සේ හමුවූයේ ය.

13. සිවුර හාත්පසින් වටකොට හැඳීම හා පෙරවීම .................................................... නමින් හඳුන්වයි.

14. ප්‍රසාදජනක පැවැත්ම සඳහා ඉවහල්වන ආචාර ධර්ම පද්ධතිය .................................................... නම් වේ.

15. ................................................................... යනු බුද්ධ වචන සඳහා සපයන අර්ථ කථන සමූහය යි.

- අංක 16 සිට 20 දක්වා පහත **A** තීරුවේ දැක්වෙන ප්‍රකාශයට ගැළපෙන පිළිතුර **B** තීරුවෙන් තෝරා **A** තීරුව ඉදිරිපස ඇති වරහන තුළ ලියන්න.

| A | | B |
|---|---|---|
| 16. තම ආරාමයට බුදුරදුන් වඩිනු දැක සිය පිරිස නිහඬ කරවූයේ | ( ) | 1. උපතිස්ස |
| 17. සැරියුත් තෙරුන්ගේ ගිහි කල නම වූයේ | ( ) | 2. තෘෂ්ණාව |
| 18. බුදුදහමට අනුව දුකට හේතුව | ( ) | 3. කාම තණ්හා |
| 19. දීඝනඛ පිරිවැජියාට දේශනා කොට ඇත | ( ) | 4. සකුළුදායි |
| 20. කම්සැප විඳීමට ඇති කැමැත්ත | ( ) | 5. වේදනා පරිග්ගහ |

(ලකුණු 2 × 20 = 40යි)

## II කොටස

- **පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද, අංක 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමිවේ**

01. i. රජෝහරණං, රජෝහරණං කියමින් සුදුරෙදි කඩක් පිරිමැදීමෙන් පසු රහත්භාවයට පත් වූ හිමි නම කවුරුන් ද?.

ii. වෙසක් පුන් පොහෝ දින සිදුවූ වැදගත් සිදුවීම් දෙකක් ලියන්න.

iii. ලෝක පාලක ධර්ම නම් කරන්න.

iv. පෙකනිය නොදක්වා - සළු ඇඳ බොලට දක්වා...... යන කවියේ ඉතිරි පද දෙක ලියන්න.

v. කර්මයේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.

vi. සම්බුද්ධ ශාසනයෙන් අඩක් පමණ පවතින්නේ කල්‍යාණමිත්‍ර ආශ්‍රය නිසා නේද? මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින් ද?

vii. මහෞෂධ පඬිතුමා විසින් විසඳන ලද ගැටලු දෙක නම් කරන්න.

viii. ජෛන ආගමික ශාස්තෘවරයාගේ නම කුමක් ද?

ix. බෞද්ධයාගේ නිත්‍ය සීලයෙන් සිල්පද දෙකක් ලියන්න.

x. "නත්ථි ලෝකෝ අනින්දිතො" යන පාලි පාඨයෙහි අර්ථය ලියන්න. (ලකුණු 20)

02. i. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව හා දේශනා කළ ස්ථානය නම් කරන්න. (ලකුණු 02)

ii. අටවැදෑරුම් දුක් වලින් 3ක් ලියන්න. (ලකුණු 03)

iii. ශිෂ්‍යයෙකුට හොඳ නරක අවබෝධ කර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න. (ලකුණු 05)

03. i. නත්ථි මේ සරණං අඤ්ඤං - බුද්ධෝ මේ සරණංවරං යන පාඨයෙහි සරල අදහස ලියන්න. (ලකුණු 02)

ii. නව අරහාදී බුදුගුණ අතරින් තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. භාවනාවෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ප්‍රයෝජන මොනවාදැ යි පෙන්වා දෙන්න. (ලකුණු 05)

04. i. යෝච පුබ්බේ පමජ්ජිත්වා
පච්ඡා සෝ නප්ප මජ්ජති
යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

ii. එම ගාථාවේ අදහස ලියන්න. (ලකුණු 03)

iii. එම ගාථාව ඇසුරින් ශිෂ්‍ය ජීවිතය ආලෝකවත් කර ගැනීමට ලබාගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 05)

05. i. බුදුරජාණන් වහන්සේ සිඟාලකට පෙන්වා දුන් සදිසාවන්ගෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. සිඟාලෝවාද සූත්‍රයට අනුව මිතුරෙකු විසින් තම මිතුරාට ඉටුකළ යුතු යුතුකම් අතරින් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. මිතුරන් ඇසුරු කිරීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් මොනවාදැ යි පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. i. සිංහල බෞද්ධ චාරිත්‍ර විධි දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ගෘහ ප්‍රවේශ මංගල්‍යය යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

iii. ඔබගේ උපන් දිනය වෙනුවෙන් ඔබට කළ හැකි බෞද්ධ චාරිත්‍ර විධි පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

**07. පහත මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.**

i. මුගලන් මහ රහතන් වහන්සේ (ලකුණු 05)

ii. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය (ලකුණු 05)

iii. අටසිල් (ලකුණු 05)

iv. ශ්‍රී පාදස්ථානය (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 08 - 2023**

## බුද්ධ ධර්මය

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 06. | ✓ | 11. | කිඹුල්වත් නුවර | 16. | යකුළුදායි |
| 02. | 2 | 07. | × | 12. | රජගහනුවර | 17. | උපතිස්ස |
| 03. | 1 | 08. | × | 13. | පරිමණ්ඩල | 18. | තෘෂ්ණාව |
| 04. | 4 | 09. | ✓ | 14. | සේඛියා | 19. | වේදනාපරිග්ගහ |
| 05. | 4 | 10. | ✓ | 15. | අටුවා | 20. | කාම තණ්හා |

### II කොටස

01. චුල්ලපන්ථක හිමි
02. බෝසත් උපත / බුද්ධත්වයට පත්වීම / පරිනිර්වාණය
03. ලැජ්ජාව / බිය (හිරිය / ඔත්තප්පය)
04. පෙකනිය නොදක්වා
    සලු ඇඳ බොලට දක්වා
    නොපව තන සක්වා
    සිනා නොමසෙන් දසන් දක්වා
05. කුසල කර්ම / අකුසල කර්ම
06. ආනන්ද හිමියන් විසින්
07. දණ්ඩක ප්‍රශ්නය / වැලියොත් ප්‍රශ්නය
08. ජෛන මහාවීර / නිගණ්ඨනාථපුත්ත
09. ප්‍රාණඝාතය / අදත්ථාදානය / කාම මිත්‍යාචාරය / මුසාවාදය / සුරාමේරය
10. මෙලොව නින්දා නොලැබූවෙකු නොමැත

02.
- i. දම්සක් පැවතුම් සූත්‍රය / බරණැස ඉසිපතනාරාමය
- ii. පෙළපොත 13 පාඩම 89 පිටුව
- iii. 13 පාඩමට අදාළව සිසුන් ලියා ඇති පිළිතුර සමස්තයක් සේ සලකා ලකුණු දෙන්න.

03.
- i. බුදුන් වහන්සේගේ සරණ හැර වෙනත් සරණක් නොමැත්තේ ය.
- ii. අරහං/සම්මාසම්බුද්ධ/විජ්ජාචරණ සම්පන්න/සුගත/ලෝකවිදූ/ අනුත්තර පුරුෂ ධම්ම සාරථී/සත්ථා දේව මනුස්සානං/බුද්ධ/භගවා
- iii. පෙළපොත 34 - 39 පිටු දෙක අදාළව සිසුවාගේ පිළිතුරට අනුව ලකුණු ලබාදෙන්න

04. i. යෝච පුබ්බේ පමජ්ජිත්වා
පච්ඡා සෝ නප්ප මජ්ජති
සෝ ඉමං ලෝකං පභාසේති
අබ්භා මුත්තෝව චන්දිමා
ii. යමෙකු මුල දී පමා වුවද පසුව නුවණින් නොපමාව කටයුතු කරන්නේ නම් හෙතෙම වළාගැබින් මිදුන පුන්සඳ මෙන් මුළුලොව බබළවයි.
iii. සිසුවා ලියා ඇති පිළිතුර සමස්තයක් සේ සළකා සුදුසු ලකුණක් පිරිනමන්න.

05. i. පෙරදිග / දකුණ / අපරදිග / උතුර / උඩ / යට
ii. පෙළපොත 10 පාඩම 75 පිටුව
iii. පෙළපොත 74 පිටුවට අදාළ කරුණු අනුව සිසුන්ගේ පිළිතුර සමස්තයක් සේ සළකා ලකුණු දෙන්න.

06. i. අකුරු කියවීම / උපන් දින / ගෘහ ප්‍රවේශ / සරණ මංගල්‍යය/ පිරිත් පිංකම් / දාන පිංකම් / අවමංගල ආදී
ii. පෙළපොත 04 පාඩම 24 - 25 පිටු
iii. පෙළපොත 04 පාඩම 24 පිටුව

07. i. පෙළපොත 45 පිටුව
ii. පෙළපොත 3 - 4 - 5 පිටු
iii. පෙළපොත 09 පාඩම 61 පිටුව
iv. පෙළපොත 12 පාඩම 86 පිටුව